27
පාඩම

# භාරතීය බ්‍රාහ්මණ සමාජ ධර්ම

භාරත ඉතිහාසයේ දැනට තහවුරු කරගෙන ඇති ඉපැරණි ම යුගයන් ලෙස මොහෙන්දොජාරෝ - හරප්පා හෙවත් ඉන්දුනිම්න ශිෂ්ටාචාරය හඳුනාගත හැකි ය. එම භාරතීය සංස්කෘතිය ආර්යාගමනයත් සමග සුවිශේෂී පරිවර්තනයකට නතු විය. එහිදී භාරතයේ විසූ මුල් ජනයා අනාර්ය නාමයෙන් හඳුන්වනු ලැබීය. එම ජනතාවගේ සංස්කෘතිය යටපත් කරගෙන පැන නැගුණු ආර්ය සංස්කෘතිය භාරතයේ තහවුරු වන්නට විය. ඍග්, යජුර්, සාමන්, අථර්වන් යන වේද යුගයන් පසු කරමින් පැමිණි වෛදික සංස්කෘතිය බ්‍රාහ්මණ සංස්කෘතියේ පදනම නිර්මාණය කළේය යන්න විද්වත් මතය යි. මෙහිලා අපගේ විශේෂ අවධානය යොමු වන්නේ ක්‍රි.පූ. හයවැනි (6) සියවසෙහි භාරතයේ ප්‍රචලිතව පැවැති එකී බ්‍රාහ්මණ සමාජ ධර්ම පිළිබඳ අධ්‍යයනයකටය.

වේද මන්ත්‍ර පරම නිෂ්ඨාව කරගත් බ්‍රාහ්මණ ඉගැන්වීම් පසු කාලීනව සමාජ නීති බවට පරිවර්තනය වූ බව මනුස්මෘතිය වැනි ග්‍රන්ථ පරීක්ෂා කිරීමෙන් තහවුරු වේ. එපමණක් නොව ඍග් වේදයට පවා පසු කාලීනව කරන ලදැයි සැළකෙන එකතු කිරීම් තුළින් මෙම බ්‍රාහ්මණ සමාජ ධර්ම තහවුරු කිරීමට ඔවුන් සතුව පැවැති අවශ්‍යතාව පසක් කරගත හැකි ය.

ඍග් වේදයෙන් ආරම්භ වන වෛදික සාහිත්‍යය වේද, බ්‍රාහ්මණ, ආරණ්‍යයක, උපනිෂද් යන සාහිත්‍යය යුග හතරක් පසුකරමින් සංවර්ධනයට පත්වූ බව පොදු පිළිගැනීමයි. බ්‍රාහ්මණ සාහිත්‍යය යුගය වැදගත් වන්නේ බ්‍රහ්මණ සමාජ ධර්ම ස්ථාපනය කිරීමට දරන උත්සාහය නිසා ය. ඒ පිළිබඳ අධ්‍යයනය මූලික වශයෙන්,

1. නිර්මාණවාදය
2. වර්ණ ධර්ම
3. ස්ව ධර්ම
4. ආශ්‍රම ධර්ම
5. ආපද් ධර්ම
6. යාගය
7. උපනයනය

ආදී මූලික ඉගැන්වීම් ලෙස දැක්විය හැකි ය. එම ඉගැන්වීම් පදනම් කරගෙන සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලනික හා ආගමික පසුබිම ද නිර්මාණය වී තිබූ බව පැහැදිළි වේ.

## නිර්මාණවාදය

මිනිසා හා අවට පරිසරය ගහ කොළ සතා සිවුපාවා, ඇළදොළ, ගංගා, මහ මුහුද, ආකාශය, ඉර හඳ, තාරකා ආදීයෙහි වෙසෙන සත්ත්වයන් ඇතුළු සමස්ත විශ්වය කිසියම් බලගතු අයෙකු විසින් මවා පාලනය කරනු ලබයි යන විශ්වාසය නිර්මාණවාදය ලෙස පිළිගැනේ. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව මේ සමස්තයේ නිර්මාපකයා මහා බ්‍රහ්මයාය. ඔහු සියල්ල දක්නා බැවින් සර්ව දර්ශීය. සෑම තැනම පැතිර ඇත. එබැවින් සර්ව ව්‍යාපීය. සෑම අතින්ම යහපත්ය. ඒ නිසා සර්වතෝ භද්‍රය. ඔහු විශ්වයේ කතෘවරයා බැවින් විශ්වස්‍ය කර්තෘ හෙවත් විශ්ව කර්තෘ ය. විශ්වයේ අසහාය මැවුම්කරුවා බැවින් විශ්ව මාපකය. එබැවින් සියල්ල ඔහුගේ වසඟයෙහි පවතී. කිසිවකුටත් එය ඉක්මවා කටයුතු කළ නොහැකිය යන්න නිර්මාණවාදයේ පදනම් වේ. එකී ඉගැන්වීම් මත පදනම්ව වර්ණ ධර්ම ආදී ඉගැන්වීම් සැකසී පවතී.

## වර්ණ ධර්ම

භාරතයේ විසූ ස්වදේශික ජනතාව කළු හමක් සහිත වූහ. ආගන්තුකව එහි පැමිණි ආර්ය ජනයා සුදු හමක් සහිත වූහ. ඒ නිසා ඔවුන් අතර සුදු-කළු වශයෙන් භේදයක් මූලිකව උපන්නේය. එය හමේ පැහැය හෙවත් වර්ණය පදනම් කරගෙන නිර්මාණය වූ බැවින් වර්ණ භේදය ලෙස හැඳින්වීය. නමුත් එයට ආගමික අර්ථයක් ආරෝපණය කිරීම නිසා පසු කාලීනව අද අප අධ්‍යයනය කරන වර්ණ ධර්ම සංකල්පය බිහිවිය යන්න විද්වත් පිළිගැනීමයි. ඍග් වේදයේ 10 වැනි මණ්ඩලයේ (මෙම කොටසේ භාෂා ලක්ෂණ අනුව ද මෙය පසු කාලීන නිර්මාණයක් වශයෙන් සැළකේ) 90 වන පුරුෂ සුක්තයේ දක්වෙන පරිදි බ්‍රාහ්මණ වර්ණ ධර්ම 4 ක් ඇති බව මෙසේ ප්‍රකාශ වේ.

> **බ්‍රාහමණොස්‍ය මුඛමාසිද් - බාහු රාජාන්‍යඃ කෘතඃ**
> **ඌරූ තදස්‍ය යද් වෛශ්‍යං - පදභ්‍යාම් ශුද්‍රෝ අජායත**

අනුපිළිවෙළින් වර්ණ භේදය ලෙස,

| | | |
|---|---|---|
| **බ්‍රාහමණ** | - | **මහා බ්‍රහ්මගේ මුවෙන් උපන්** |
| **ක්ෂත්‍රීය** | - | **මහා බ්‍රහ්මගේ බාහුවලින් උපන්** |
| **වෛශ්‍ය** | - | **මහා බ්‍රහ්මගේ කලවාවලින් උපන්** |
| **ශුද්‍ර** | - | **මහා බ්‍රහ්මගේ යටි පතුල්වලින් උපන්** |

යනුවෙන් සිවු වර්ණයක් බ්‍රාහ්මණයින් විසින් හඳුන්වාදෙනු ලැබී ය.

මෙහි දී අපගේ අවධානයට ලක්විය යුතු විශේෂ කාරණයක් වන්නේ මුලින් සඳහන් කළ වර්ණ තුන ආර්යයන් වන බවත් ඔවුන්ට කිසියම් ප්‍රමාණයක අයිතිවාසිකම් ප්‍රමාණයක් හිමිව පැවැති බවත්ය. නමුත් බ්‍රාහ්මණ හැඳින්වීමට අනුව **අකර්මණ, අබ්‍රාහ්මණ, අද්වර්යු, ශිෂ්ණදේව** නම් වූ අනාර්යයන් බ්‍රාහ්මණයින්ගේ හතුරන් ලෙස සළකා ඔවුන්ට **දේශපාලන, ආර්ථික, සාමාජික, ආගමික, අධිකරණ** යනාදී ක්ෂේත්‍රයන්හි කිසිදු අයිතිවාසිකමක් හිමි නොවීය. අනාර්යයන් සමාජයෙන් කොන් කොට වෙන් කර තැබීමේ ඊළඟ පියවර වශයෙන් ඔවුහු ස්වධර්ම නමින් ඒ ඒ වර්ණයට අදාළ වෘත්තීන් ද මහා බ්‍රහ්මගේ නියමයන් ලෙස ඉදිරිපත් කළහ. මෙහිදී බමුණන් උත්සහ කළේ සියලු වර්ණයන් අතර තම ආධිපත්‍යය තහවුරු කර ගැනීම ය.

### බ්‍රාහ්මණ ස්වධර්ම

> **අධ්‍යාපන මධ්‍යයනං - යජනං යාජනං තථා**
> **දානං ප්‍රතිග්‍රහණංචෛව - බ්‍රාහමණානාමකල්පයත්**

- **ඉගැනීම** - **අධ්‍යයනං**
- **ඉගැන්වීම** - **අධ්‍යාපනං**
- **යාග කිරීම** - **යජනං**
- **යාග කරවීම** - **යාජනං**
- **දානය** - **දානං**
- **දන් පිළිගැනීම** - **ප්‍රතිග්‍රහණං**

යන කරුණු බ්‍රාහ්මණයින් විසින් පමණක් සිදු කළ යුතු කටයුතු ලෙස සළකන ලදී. එ බැවින් ඒවා බ්‍රාහ්මණ ස්ව ධර්ම නම් වීය.

### ක්ෂත්‍රිය ස්වධර්ම

> **ප්‍රජානං රක්ෂණං දානමිජ්‍යාධ්‍යනමෙවච**
> **විෂයෙශ් ච ප්‍රශක්තිශ් ච ක්ෂත්‍රියස්‍ය සමාසතඃ**

- **ප්‍රජා රක්ෂණය** - **ප්‍රජානං රක්ෂණං**
- **දන්දීම** - **දානම්**
- **යාග කරවීම** - **ඉජ්‍යා**
- **වේද අධ්‍යන** - **අධ්‍යයනං**
- **කාමයෙහි නොඇලීම** - **විෂයේශ ච ප්‍රශක්තිශ් ච**

යන කරුණු ක්ෂත්‍රියයන් විසින් සිදු කළ යුතු කටයුතු ලෙස සළකන ලදී. එබැවින් ඒවා **ක්ෂත්‍රිය** ස්ව ධර්ම නම් වීය.

**වෛශ්‍ය ස්වධර්ම**

> **පශූනං රක්ෂණං දාන - මිජ්‍යාධ්‍යනමෙවච**
> **වණික් පථං කුසීදඤ්ච - වෛශ්‍යස්‍ය කෘෂිමෙව ච**

- පශු රක්ෂණය - පශූනංරක්ෂණං
- දානය - දානං
- යාග කරවීම - ඉජ්‍යා
- වේද අධ්‍යනය - අධ්‍යයනං
- වෙළෙදාම - වණික් පථං
- මුදල් පොළියට දීම - කුසීදං ච
- කෘෂිකර්මය - කෘෂිං

යන කරුණු වෛශ්‍යයන් විසින් සිදු කළ යුතු කටයුතු ලෙස සළකන ලදී. එබැවින් ඒවා **වෛශ්‍ය ස්ව ධර්ම** නම්වීය.

**ශුද්‍ර ස්ව ධර්ම**

> **එකමෙවතු ශුද්‍රස්‍ය ප්‍රභූඃ කර්ම සමාදිශන්**
> **එතෙෂාමෙව වර්ණානං ශුශ්‍රෑ ෂාධනසූයයා**

බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය යන ප්‍රභූ වර්ණවලට කීකරුව දාසකම් කිරීම ම ශුද්‍ර වර්ණයට හිමි එකම ස්ව ධර්මය වීය.

**ආපද් ධර්ම**

මෙම වර්ණ ධර්ම හා ස්වධර්ම සංකල්පය තවදුරටත් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉගැන්වීමක් ලෙස **ආපද් ධර්ම** යන ඉගැන්වීම ගත හැකි ය. ආපදාපන්න අවස්ථාවක දී මෙකී ස්ව ධර්ම වෙනස් කර ගත හැකි ය, යන්න එහි අදහසයි. එනම් ජලගැල්මක්, ලැව් ගින්නක්, සොරසතුරු උවදුරක්, දුර්භික්‍ෂයක් වැනි විපත්ති කර අවස්ථාවක අවරෝහණ ක්‍රමයට ස්ව ධර්ම ඉක්මවා යෑමේ නිදහසයි. බමුණාට තමාට වඩාපහත් වර්ණවල ස්ව ධර්ම ද, ක්‍ෂත්‍රියයාට තමාට වඩා පහත් වර්ණවල ස්ව ධර්ම ද, ද එබඳු අවස්ථාවක තම පැවැත්ම වෙනුවෙන් ක්‍රියාත්මක කළ හැකි ය. නමුත් පහත් වර්ණයකට අයිති වූවෙකුට ඊට වඩා ඉහළ වර්ණයක ස්ව ධර්ම ක්‍රියාවට නැඟිමේ අවකාශයක් නොලැබෙන බව මෙහිදී අවධාරණය කෙරේ.

**ආශ්‍රම ධර්ම**

තවත් බ්‍රාහ්මණ ඉගැන්වීමක් ලෙස ආශ්‍රම ධර්ම පිළිබඳ මතය දැක්විය හැකි ය. ඒ

අනුව උපතේ සිට මරණය දක්වා පුද්ගල ජීවිතය ගත කළ යුතු ආකාරය ආශ්‍රම ධර්ම මඟින් ඉගැන්වෙයි. එනම්,

**බ්‍රහ්මචාරී - ශිෂ්‍ය අවධිය**

බ්‍රහ්මචාරී ව පිරිසිදු ජීවිතයක් ගතකරමින් වේදවේදාංග ප්‍රධාන කරගත් ශිල්ප ශාස්ත්‍ර හැදෑරීම.

**ගෘහස්ථ - තරුණ අවධිය**

විවාහකව දූ පුතුන් ලබමින් , පස්කම් සුව විඳිමින්, යාග විධි ආදී ආගමික වතාවත් පැවැත්වීම. මව්පියන් අඹුදරුවන් පෝෂණය කිරීම ආදී ගිහි ජීවිතයේ කටයුතුවලින් තෘප්තිමත් වීම.

**වානප්‍රස්ථ - මැදිවිය**

තරුණ වයස ඉක්මවායත්ම ලෞකික සැප සම්පත් අත්හැර වන ගතව තාපස ජීවිතයක් ගත කිරීම.

**සන්‍යාසි - මහළු විය**

සම්පූර්ණයෙන් ම ආගමික, අල්පේච්ඡ, නිෂ්කාමී සංචාරක ජීවිතයක් ගත කරමින්, ආගමික වතාවත් ඉටුකරමින් නිදහස්ව විවේකීව කටයුතු කිරිම, මරණයට සූදානම් වන කාලසීමාව වශයෙන් එකී ආශ්‍රම ධර්ම පිළිබඳ ඉගැන්වීම් දැක්විය හැකි ය. කාලිදාසයන් රඝුවංශයෙහි සඳහන් කරන පරිදි,

- **ශෛෂවේභ්‍යස්ථ විද්‍යානාම්** - සිසු අවධියේ ඉගෙනීම - **බ්‍රහ්මචාරී**
- **යෞවනෙවිෂයෛෂිනාම්** - යොවුන් වියේ කම් සැප විඳීම - **ගෘහස්ථ**
- **වාර්ධකෙ මුනිවෘත්තිනාම්** - වැඩිහිටිවියේ දී තාපස චර්යාව - **වානප්‍රස්ථ**
- **යෝගෙනාන්තේ තනුත්‍යජම්** - සැදෑ සමයේ දී ත්‍යාගය - **සන්‍යාසි**

වශයෙන් දක්වා තිබේ. මේ අනුව පුරාතන භාරතීය සමාජය බ්‍රාහ්මණ ඒකාධිකාරයක් ඔස්සේ සකස්ව පැවති බව පැහැදිලිය. බුදුරදුන්ගේ පහළවීමත් සමග මෙම තත්ත්වයෙහි පූර්ණ වෙනසක් සිදු වුණි. ඒ ජනතාව ආර්ය මාර්ගයට යොමු වීම නිසයි.

**අභ්‍යාසය**

01. බුද්ධකාලීනව වාසය කල බමුණන් පස්දෙනෙක් නම්කරන්න.
02. බ්‍රාහ්මණ සමාජය පිළිබඳ තොරතුරු රැස්කර වාර්තාවක් ලියන්න.